**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

වෙත යොමු කරන ලද

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන්

**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු එස්.එම් මරික්කාර් මහතා, පා.ම. විසිනි**

**2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා**

---

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு ஆற்றுப்படுத்தப்பட்ட**

**இலங்கை மின்சாரம் (திருத்தச்) சட்டமூலம்**

**மீதான**

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**அறிக்கை**

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**தவிசாளர்**

**கௌரவ எஸ்.எம்.மரிக்கார், பா.உ. அவர்களால்**

**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**

**2025 யூலை 22, செவ்வாய்க்கிழமை.**

---

**Report of the**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**on**

**Sri Lanka Electricity (Amendment) Bill**

**referred to**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**Presented to Parliament by**

**Hon. S.M. Marikkar, M.P.**

**Chair of the**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**Tuesday, 22 July 2025**

## කාරක සභාවේ වාර්තාව

2025 ජූලි මස 11, 2025 ජූලි මස 15 සහ 2025 ජූලි මස 17 යන දිනයන්හිදී පාර්ලිමේන්තුවේදී රැස් වූ යටිතල පහසුකම් හා උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- **ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත**
  (2025 මැයි මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව යටිතල පහසුකම් හා උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**2025 ජූලි මස 11**

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්**
ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම., (සභාපති)
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, පා.ම.
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා, පා.ම.
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්**
ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
ගරු තනුර දිසානායක මහතා, පා.ම.

වූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) - කාරක සභාවේ ලේකම්

**සහභාගී වූ නිලධාරීන්**

**බලශක්ති අමාත්‍යාංශය**
කේ.එල්.ආර්.සී විජේසිංහ මහතා, අතිරේක ලේකම්, විදුලි බල හා විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ
ඉංජිනේරු පුබුදු නිරෝෂන හැඳිගල්ලගේ මහතා , අධ්‍යක්ෂ ජනරාල්, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය
ආචාර්ය ඉන්ද්‍රා මාකලන්ද මහතා, සාමාජික, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය

**ලංකා විදුලිබල මණ්ඩලය**
මහාචාර්ය සාලිය ජයසේකර මහතා, සභාපති
ඉංජිනේරු ඩබ්. එදුස්සූරිය මහතා, වැඩබලන සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු එච්.ආර්.පී. වන්නිආරච්චි මහතා , අතිරේක සාමාන්‍යාධිකාරී බෙදාහැරීම් අංශය
ඉංජිනේරු ආර්.කේ.පී.එස්. ගුණතිලක මහත්මිය, අතිරේක සාමාන්‍යාධිකාරී, ආයතනික උපායමාර්ග
ඉංජිනේරු එම්.එම්. අලියාර් මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ සම්බන්ධතා කාර්යාලය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
මහාචාර්ය ටී.එම්.ඩබ්.ජේ. බණ්ඩාර, සභාපති
චමිල ජයසේකර මහතා, අධ්‍යක්ෂ

**ලංකා විදුලිබල සමාගම**
ජී.ජේ. අලුත්ගේ මහතා, සභාපති
ආචාර්ය පී.එස්.එන්.ද සිල්වා මහතා, සාමාන්‍යාධිකාරී
එස්.ඩී.සී. ගුණවර්ධන මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
මධුර ගමගේ මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
දමිත කුමාරසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්
කාංචන සිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
යසන්ත රතුවිතාන මහතා, අධ්‍යක්ෂ, පාරිභෝගික බලපත්‍ර
අමිල රාජපක්ෂ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, බලපත්‍ර

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**
ආර්.පී. කොඩිතුවක්කු මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක
ආර්.සී. මිහිරානි මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය**
ඉංජිනේරු මහාචාර්ය ඩබ්.ඩී. අසංක එස් රොද්‍රිගු මහතා
ඉංජිනේරු එන්.ආර්. ජයසිංහ මහතා
ඉංජිනේරු බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා

**නීතිපති දෙපාර්තමේන්තුව**
වී.එස්.පී. සිරිවර්ධන මහත්මිය, අතිරේක සොලිසිටර් ජනරාල්
ඉෂාරා මධාරසිංහ මහත්මිය, රජයේ නීතිඥ

**ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce)**
රියාස් එම්.සංගනී මහතා, සම සභාපති, බලශක්ති කමිටුව
ශිරාන් ප්‍රනාන්දු මහතා, ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති උපදේශක

**ජාතික වාණිජ මණ්ඩලය (National Chamber of Commerce)**
ආචාර්ය ලක්මාල් ප්‍රනාන්දු මහතා, MD/CEO-Regan Renewables PVT LTD
එල්.පී. ජයසිංහ මහතා, MD-Geotech PVT LTD

**ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරුවරුන්ගේ සභාව**
ඉංජිනේරු ටී.ඒ. වන්නිආරච්චි මහතා
ඉංජිනේරු ඉසුරු කස්තුරිරත්න මහතා

**පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්ගේ සම්මේලනය**
ජී.ජී.එස්. ගෝමස්, නියෝජිත

**වහල මත සූර්ය පැනල සංවර්ධකයන්ගේ සංගමය**
එච්.එස්.පී.පතිරාජ මහතා, සභාපති
ටී. ත්‍රියාම්බගන් මහතා, භාණ්ඩාගාරික
ඩී.එන්. ගුණවර්ධන මහතා, සාමාජික

**උපදේශක**
නිහාල් සූරියආරච්චි මහතා, ඉංජිනේරු

**2025 ජූලි මස 15**

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**
ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම., (සභාපති)
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
ගරු. නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, පා.ම.
ගරු අසිත නිරෝෂණ එගොඩවිතාන මහතා, පා.ම.
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්**
ගරු කබීර් හෂීම් මහතා, පා.ම.

වූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) - කාරක සභාවේ ලේකම්

**සහභාගී වූ නිලධාරීන්**

**බලශක්ති අමාත්‍යාංශය**
මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල මහතා, ලේකම්, බලශක්ති අමාත්‍යාංශය
කේ.එල්.ආර්.සී. විජයසිංහ මහතා, අතිරේක ලේකම් (බලශක්ති හා බලශක්ති අංශ ප්‍රතිසංස්කරණ)
ඉංජිනේරු පුබුදු නිරෝෂන හැඳිගල්ලගේ මහතා , අධ්‍යක්ෂ ජනරාල්, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය
ආචාර්ය ඉන්ද්‍රා මාකලන්ද මහතා, සාමාජික, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය

**ලංකා විදුලිබල මණ්ඩලය**
ඉංජිනේරු ඩබ්. එදුස්සූරිය, වැඩබලන සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු එච්.ආර්.පී. වන්නිආරච්චි මහතා , අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීම් අංශය)
ඉංජිනේරු ආර්.කේ.පී.එස්. ගුණතිලක මහත්මිය, අතිරේක සාමාන්‍යාධිකාරී, ආයතනික උපායමාර්ග
ඉංජිනේරු එම්.එම්. අලියාර් මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ සම්බන්ධතා කාර්යාලය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
ටී.එම්.ඩබ්.ජේ. බණ්ඩාර මහතා, සභාපති

**ලංකා විදුලිබල සමාගම**
ජී.ජේ. අලුත්ගේ මහතා, සභාපති
ආචාර්ය පී.එස්.එන්.ද සිල්වා මහතා, සාමාන්‍යාධිකාරී
එස්.ඩී.සී. ගුණවර්ධන මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
මධුර ගමගේ මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
දමිත කුමාරසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්
කාංචන සිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
යසන්ත රතුවිතාන මහතා, අධ්‍යක්ෂ, පාරිභෝගික බලපත්‍ර
අමිල රාජපක්ෂ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, බලපත්‍ර

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**
ආර්.පී. කොඩිතුවක්කු මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක
ආර්.සී. මිහිරානි මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**නීතිපති දෙපාර්තමේන්තුව**
වී.එස්.පී. සිරිවර්ධන මහත්මිය, අතිරේක සොලිසිටර් ජනරාල්
මේධක ප්‍රනාන්දු මහතා, රජයේ නීතිඥ

**ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරුවරුන්ගේ සංගමය**
ඉංජිනේරු ඉසුරු කස්තුරිරත්න මහතා

**එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම**
ධම්මික නානායක්කාර මහතා, නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරි (මෙහෙයුම්)
සුරින්දි විජේතුංග මහත්මිය, විදුලි ඉංජිනේරු
සුදත් අන්නාසිවත්ත මහතා, ප්‍රධාන මෙහෙයුම් නිලධාරි

**උපදේශක**
නිහාල් සූරියආරච්චි මහතා, ඉංජිනේරු

## 2025 ජූලි මස 17

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**
ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම., (සභාපති)
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
ගරු. නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
ගරු. මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
ගරු අසිත නිරෝෂණ එගොඩවිතාන මහතා, පා.ම.
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්**
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.

චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) - කාරක සභාවේ ලේකම්

**සහභාගී වූ නිලධාරීන්**

**බලශක්ති අමාත්‍යාංශය**
මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල මහතා, ලේකම්, බලශක්ති අමාත්‍යාංශය
කේ.එල්.ආර්.සී. විජයසිංහ මහතා, අතිරේක ලේකම් (බලශක්ති හා බලශක්ති අංශ ප්‍රතිසංස්කරණ)
ඉංජිනේරු පුබුදු නිරෝෂන හැඳිගල්ලගේ මහතා , අධ්‍යක්ෂ ජනරාල්, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය
ආචාර්ය ඉන්ද්‍රා මාකලන්ද මහතා, සාමාජික, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය

**<u>ලංකා විදුලිබල මණ්ඩලය</u>**
*ඉංජිනේරු ඩබ්. එදුස්සූරිය, වැඩබලන සාමාන්‍යාධිකාරී*
ඉංජිනේරු එච්.ආර්.පී. වන්නිආරච්චි මහතා , අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීම් අංශය)
ඉංජිනේරු ආර්.කේ.පී.එස්. ගුණතිලක මහත්මිය, අතිරේක සාමාන්‍යාධිකාරී, ආයතනික උපායමාර්ග
ඉංජිනේරු එම්.එම්. අලියාර් මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ සම්බන්ධතා කාර්යාලය

**<u>ලංකා විදුලිබල සමාගම</u>**
ජී.ජේ. අලුත්ගේ මහතා, සභාපති
ආචාර්ය පී.එස්.එන්.ද සිල්වා මහතා, සාමාන්‍යාධිකාරී
එස්.ඩී.සී. ගුණවර්ධන මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
මධුර ගමගේ මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

**<u>ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව</u>**
දමිත කුමාරසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්
කාංචන සිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
යසන්ත රතුවිතාන මහතා, අධ්‍යක්ෂ, පාරිභෝගික බලපත්‍ර
අමිල රාජපක්ෂ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, බලපත්‍ර

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>**
ආර්.පී. කොඩිතුවක්කු මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක
ආර්.සී. මිහිරානි මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**<u>නීතිපති දෙපාර්තමේන්තුව</u>**
වී.එස්.පී. සිරිවර්ධන මහත්මිය, අතිරේක සොලිසිටර් ජනරාල්
මේධක ප්‍රනාන්දු මහතා, රජයේ නීතිඥ

**<u>උපදේශක</u>**
නිහාල් සූරියආරච්චි මහතා, ඉංජිනේරු

**<u>හැඳින්වීම</u>**

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යනු විදුලිබල කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලසීමට; ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීමට; 2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට මෙම පනතේ විධිවිධාන අනුව විදුලිබල කර්මාන්තය සඳහා නියාමකයා වීමට විධිවිධාන සැලසීමට; විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, වෙළඳාම, සැපයීම සහ ප්‍රසම්පාදනය සම්බන්ධ සියලු ක්‍රියාකාරකම්වලට අදාළව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ආයතන, , සංස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග සැපයීමට; සියලුම අදාළ ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ක්‍රියාවලි පැහැදිළිව හඳුනාගැනීමට; 2009 අංක 20 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත අවලංගු කිරීමට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලසීමට සම්මත කරන ලද පනතකි.

මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ ප්‍රධාන අරමුණ වශයෙන් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම සහ ප්‍රධාන පනතේ වගන්ති 20ක් යටතේ වෙනස්කම් සිදු කිරීම මගින්, එම පනතේ අරමුණු ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියට සහ එහි ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල බව සහතික කිරීම දැක්විය හැකිය.

යෝජිත විදුලිබල පනත එහි සංශෝධන, එහි විවිධ පැතිකඩ සහ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡාවට භාජනය වූ කරුණු පහත දක්වා ඇත.

**<u>ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL)</u>**

වර්තමාන කෙටුම්පත මගින් පාරිභෝගික අයිතිවාසිකම් සහ විස්තීරණ සැපයුම්කරු සේවා සංග්‍රහය වැනි පෙර පනත්වල පැහැදිලිව අන්තර්ගතව තිබූ විධිවිධාන ඉවත් කිරීමෙන් පාරිභෝගික අයිතිවාසිකම් සැලකිය යුතු ලෙස දුර්වල කරන බව මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) අවධාරණය කර තිබේ.මහල් නිවාස සංකීර්ණ සහ විදුලි වාහන ආරෝපණ ස්ථාන වැනි පෞද්ගලික ආයතනවලට අභ්‍යන්තරව විදුලිය බෙදා හැරීමට පෙර ඉඩ දුන් නිදහස් කිරීම් ඉවත් කිරීම නිසා එම ක්‍රියාකාරකම් නීතිවිරෝධී වන අතර එමගින් දහස් ගණනක් පාරිභෝගිකයින්ට බලපෑමට ලක්විය හැකි බව ඔවුන් පෙන්වා දී තිබේ. මහජන උපයෝගිතා

කොමිෂන් සභාව විදුලි රැහැන් හා සම්බන්ධ ඉඩම් අත්පත් කර ගැනීම් සහ වන්දි ලබාදීම සඳහා වූ විධිවිධාන නැවත හඳුන්වා දෙන ලෙසද ඉල්ලා සිටී.

තීරුබදු නියම කිරීම සඳහා මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමේ යෝජිත අවශ්‍යතාවයට මහජන උපයෝගිතා කොමිෂන් සභාව දැඩි ලෙස විරෝධය පළ කළ අතර එවැනි පියවර තම ස්වාධීනත්වයට 100% හානිකර වන බවත්, තාක්ෂණික ක්‍රියාවලියක් දේශපාලන මැදිහත්වීමට යටත් කරන බවත් පෙන්වා දී තිබේ. ජලය සහ තෙල් වැනි වෙනත් උපයෝගිතා නියාමනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලය පුළුල් කිරීමටද ඔවුන් යෝජනා කර තිබේ.

මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙම සංශෝධන සලකනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩල (CEB) ආයතනවල කටයුතු සැබෑ "විවිධාංග කිරීමකට" වඩා "නැවත ඒකරාශී කිරීමක්" ලෙස වන අතර එය තරඟකාරිත්වය සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ මුල් අරමුණ ආපසු හැරවීමක් වන බව ඔවුන්ගේ විශ්වාසය යි. ජාතික ජාල සේවා සැපයුම්කරු හට විදුලි උත්පාදනයට සම්බන්ධ වීම පැහැදිලිවම තහනම් කර ඇති සන්දර්භයක් තුළLTL හෝල්ඩිංග්ස් ආයතනය ජාතික ජාල සේවා සැපයුම්කරු (NTSP) යටතට පත් කිරීමට යෝජනා කිරීම විශේෂිත ගැටළුවක් වන අතර මෙය සැලකිය යුතු ලෙස බැඳියා පිළිගැටුමක් ඇති කරයි.

## ලංකා විදුලිබල මණ්ඩලය (CEB)

රාජ්‍ය ආයතනයක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) දෘෂ්ටිකෝණය, සම්ප්‍රේෂණ සමාගම (Transco) 100% රාජ්‍ය හිමිකාරිත්වයට පත් කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්ති තීරණයට අනුකූල වේ. මෙම ප්‍රවේශය රජයේ ප්‍රතිපත්තියක් ලෙස නිර්වචනය කරනු ලබන අතර, වසර අටක් පුරා ඇස්තමේන්තුගත ඇමරිකානු ඩොලර් බිලියන 5ක සම්ප්‍රේෂණ ජාල පුළුල් කිරීම සඳහා වන අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව සහ JICA වැනි සංවර්ධන නියෝජිත ආයතනවලින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි.

තාක්ෂණික අතින්, ලංකා විදුලි බල මණ්ඩලය විදුලි බෙදාහැරීම සඳහා "අවම පිරිවැය තාක්ෂණික ශක්‍යතා මූලධර්මයට" වඩා "ආර්ථිකමය වශයෙන් ආරක්ෂාකාරී මෙහෙයවීමේ සීමාවන්ට යටත්ව ප්‍රේෂණය කිරීම" වෙනුවෙන් කටයුතු කර තිබේ. "අවම පිරිවැය" පිරිවැය අවම කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කරන අතර, "ආර්ථිකමය සම්ප්‍රේෂණය" යන්නට ජාල ස්ථායිතාව, විශ්වසනීයත්වය සහ සැපයුම් ආරක්ෂාව වැනි පුළුල් සාධක ඇතුළත් වන බවත්, එය පිරිවැය අවම කිරීමට වඩා ප්‍රතිලාභ උපරිම කිරීම අරමුණු කරගත් වෙළඳපල ආකෘතියකට වඩාත් සුදුසු බවත් ඔවුන්ගේ තර්කය වේ.

## ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO)

යෝජිත විදුලිබල පනත් සංශෝධන තුළ ලංකා විදුලි (පුද්ගලික) සමාගම එහි ස්වාධීනත්වය සහ ඉහළ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව පවත්වා ගැනීමේ තීරණාත්මක වැදගත්කම පිළිබඳ නිරන්තරයෙන් අවධාරණය කළේය. ලංකා විදුලි (පුද්ගලික) සමාගම දැනට වෙනම සහ කාර්යක්ෂම බෙදාහැරීමේ සමාගමක් ලෙස ක්‍රියාත්මක වන අතර, එහි නියෝජිතයෝ එහි කාර්යයන් සහ කොටස් විශාල, ඒකාබද්ධ බෙදාහැරීමේ සමාගමක් යටතේ "නැවත ඒකරාශී කිරීම" මගින් එහි ස්වාධීනත්වය සහ සේවා ගුණාත්මකභාවය බාදනය විය හැකි බවට කනස්සල්ල පළ කළහ. ලංකා විදුලිබල මණ්ඩලයට වඩා ලංකා විදුලි (පුද්ගලික) සමාගම ඔප්පු කරන ලද කාර්යක්ෂමතාව ප්‍රධාන වශයෙන් එහි ස්වාධීනත්වය නිසා බව ඔවුහු අවධාරණය කළහ.

## ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරු සංගමය

නිශ්චිත කාල පරිච්ඡේදයකින් පසු සම්ප්‍රේෂණ මාර්ග කොරිඩෝර (වත්කම් නොව) ශ්‍රී ලංකා රජයට ආපසු ලබා දීම සහතික කිරීම සඳහා පැහැදිලි විධිවිධානයක් නොමැත.

## ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින්ගේ සම්මේලනය

යෝජිත ව්‍යුහය මගින් මෙම අංශය තනි ඒකාධිකාරයකින් සංකේන්ද්‍රිත කතිපයාධිකාරයක් (oligopoly) බවට ඵලදායී ලෙස මාරු කරයි. LTL වැනි ආයතන සමඟ උත්පාදන හා බෙදාහැරීමේ අනුබද්ධිත සමාගම් තනි සම්ප්‍රේෂණ ආයතනයක් යටතට පත් කිරීම මගින්, විවිධාංග කිරීම (unbundling) මගින් අපේක්ෂා කළ ස්වාධීනත්වය, අවධානය සහ වගවීම සැලකිය යුතු ලෙස අඩපණ කරයි. සැබෑ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කරා ඉදිරියට යාම වෙනුවට, මෙම යෝජනාව වත්මන් පද්ධතියේ වඩාත් සංකීර්ණ, අඩු විනිවිදභාවයකින් යුත් ස්වරූපයකට පත් වීමේ අවදානමක් ඇති වේ.

## ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය – IESL

ජාතික විදුලිබල උපදේශක සභාව (NEAC) වෙනුවට අමාත්‍යවරයෙකු විසින් පත් කරන ලද කමිටුවක් පත් කිරීම තුළ ආයතනික ස්වාධීනත්වයක් සහ බහු-පාර්ශ්වකරුවන්ගේ නියෝජනයක් නොමැති වීම සිදුවේ.

තීරුබදු කාරණා සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාවට යෝජිත අවශ්‍යතාවය මූලික නියාමන කාර්යයන්ට දේශපාලන මැදිහත්වීම් සිදුවීමේ අවදානමක් ඇති කරයි.

<u>වහල මත සූර්ය පැනල සංවර්ධකයන්ගේ සංගමය</u>

අවම පිරිවැය තාක්ෂණික ශක්‍යතා මූලධර්මය වෙනුවට " ආර්ථිකමය වශයෙන් ආරක්ෂාකාරී මෙහෙයවීමේ සීමාවන්ට යටත්ව ප්‍රේෂණය කිරීම "  යන සංකල්පය හඳුන්වා දීම තුළ තීරුබදු පැනවීමේදී පාරිභෝගිකයාට අහිතකර ලෙස බලපෑ හැකිය.

සලකා බැලීමෙන් පසු, කාරක සභාව පහත සඳහන් සංශෝධන සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය සහ කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පනත් කෙටුම්පතට කාරක සභා අවධියේදී ඇතුළත් කිරීමට නිර්දේශ කළේය.

1. **10. (2) (අ) වගන්තිය සංශෝධනය: ජාතික පද්ධති ක්‍රියාකරුගේ වගකීම්**
   ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වගන්තියේ (අ) ඡේදයේ සඳහන් අරමුණු වලින් එකක්, අඛණ්ඩ හා විශ්වාසදායක විදුලිබල සැපයුමක් සහතික කිරීම සඳහා වෙනස් කර ඇත. මෙම සංශෝධනය මගින් අඛණ්ඩ හා විශ්වාසදායක විදුලිබල සැපයුම සහතික කිරීමේ වගකීම ජාතික පද්ධති ක්‍රියාකරුට පවරයි.

2. **14. (2) වගන්තිය සංශෝධනය: අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා**
   මෙම සංශෝධනය මගින් අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙකු විසින් ඉදිකරන ලද සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරීත්ව කාලය නියම කරයි.

3. **18. (3) (ඉ) (ii) වගන්තිය සංශෝධනය: විශ්‍රාම වැටුප් අරමුදලට ඇති බැඳීයාව**
   මෙම සංශෝධනය මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදල් බැඳීම් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනයේ (ඌ) (ii) අයිතමයේ සඳහන් සමාගමට පවරයි.

4. **20 වගන්තිය සහ 1 වන උපලේඛනය සංශෝධනය: විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය**
   LTL හෝල්ඩිංග්ස් ලිමිටඩ් (LTLH) සහ ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගම (SLE) හි ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සතු කොටස් පිළිවෙලින් 35% සහ 100% NTNSP වෙත සංශෝධන පනත් කෙටුම්පතට අනුව පැවරීමට නියමිතය. සමහර පාර්ශ්වකරුවන් මෙම කොටස් සෘජුවම භාණ්ඩාගාරයට හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනයේ (අ) අයිතමයේ සඳහන් උත්පාදන සමාගමට පැවරීමට ඉල්ලා සිටියහ.

   මූලික පැවරීමේ සැලැස්මට අනුව සංස්ථාපිත කිරීමට නියමිත අනුප්‍රාප්තික සමාගම් හයක් (6) ඇත; එනම්, (අ) **අයිතමයෙහි** හි සඳහන් උත්පාදන සමාගම, (ඉ) **අයිතමයෙහි** හි සඳහන් NTNSP,  (ඊ) **අයිතමයෙහි** හි සඳහන් NSO,  (උ) **අයිතමයෙහි** හි සඳහන් බෙදාහැරීමේ සමාගම, සහ  (ඌ) (එ) **අයිතමයෙහි** හි සඳහන්  ඉහත (අ), (ඉ), (ඊ) සහ (උ) හි සඳහන් නොවන ලංකා විදුලි බල මණ්ඩලයෙහි කාර්යයන් භාර ගැනීමට එක් සමාගමක් සහ මූලික පනතේ 1 වන උපලේඛනයේ  (ඌ) (ii) අයිතමයේ සඳහන් අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල භාර ගැනීමට එක් සමාගමක්.

   ලංකා විදුලි බල මණ්ඩලය සතු LTLH සහ SLE කොටස් උත්පාදන සමාගමට හෝ බෙදාහැරීමේ සමාගමට පැවරීමෙන් විදුලිබල වෙළඳපල තුළ විශාල ඒකාධිකාරයක් නිර්මාණය වේ. NSO වෙත පැවරීමෙන් බැඳියා පිළිගැටුමක් ඇති වේ.  (ඌ) (ii) **අයිතමයෙහි** හි සඳහන් සමාගම අරමුදල් කළමනාකරණයට පමණක් සීමා වේ.

   එබැවින්, හැකි එකම විකල්ප වන්නේ NTNSP වෙත හෝ (ඌ) (i) අයිතමයෙ හි සඳහන් සමාගමට පැවරීමයි. බලශක්ති අමාත්‍යාංශය සංශෝධන පනත් කෙටුම්පතේදී LTLH සහ SLE, NTNSP හි අනුබද්ධ සමාගම් ලෙස එහි වත්කම් ලෙස තබා ගැනීමට සලකා බලන ලදී. මෙය NTNSP හි සම්ප්‍රේෂණ ජාල සංවර්ධනය සඳහා වෙනත් ආදායමක් ඇති කරනු ඇත.

   කෙසේ වෙතත්, මෙම සංශෝධනයෙන් අපේක්ෂා කරන්නේ  ආංශික අධීක්ෂණ කාරක සභාවේ සහ LTLH කළමනාකාරිත්වයේ ඉල්ලීම සලකා බලමින්, ලංකා විදුලිබල මණ්ඩලය සතු LTLH සහ SLE හි කොටස් (ඌ) (i) අයිතමයෙහි හි සඳහන් සමාගමට පැවරීමයි.

5. **13 වගන්තිය සංශෝධනය: I වන උපලේඛනයේ (ඌ) (i) අයිතමයෙහි හි සඳහන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය**
   මෙම සංශෝධනය මගින් (ඌ) (i) අයිතමයේ සඳහන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුදුසුකම් නිර්ණායක නියම කරයි.

6. **13 වගන්තිය සංශෝධනය: අනුප්‍රාප්තික සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීම**
මෙම සංශෝධනය අනුප්‍රාප්තික සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම සඳහාය.

7. **18 (2) (ආ) වගන්තිය සංශෝධනය: අවසාන පැවරීමේ සැලැස්ම**
මෙම සංශෝධනය මගින් අවසාන පැවරීමේ සැලැස්ම සකස් කිරීමේ කාලය වසරකින් අඩු කරයි.

8. **28. (1) වගන්තිය සංශෝධනය: ව්‍යවස්ථාපිත ව්‍යතිරේකයන්**
මෙම සංශෝධනය මගින් නිවාස සංකීර්ණ වැනි විශේෂ අරමුණු සඳහා විදුලිය සැපයීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත ව්‍යතිරේකයන් සඳහා සහාය දක්වයි.

9. **II වන උපලේඛනය සහ III වන උපලේඛනය සඳහා සංශෝධන**
මෙම සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තියේ කෙටුම්පත් කිරීමේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට සිදු කරන ලද අදාළ සංශෝධන සහිතව ප්‍රධාන පනතේ II වන උපලේඛනය සහ III වන උපලේඛනය ආදේශ කිරීමයි.

<u>කාරක සභාවේ තීරණය</u>

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව ඉහත සඳහන් පනත් කෙටුම්පතට එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්.එම්. මරික්කාර් මහතා විසින් 2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.